# මධ්‍යම පළාත් සභාව
# மத்திய மாகாண சபை
# CENTRAL PROVINCIAL COUNCIL

## මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන

## மத்திய மாகாண பிரதான மற்றும் கல்வி

## Central Provincial Chief And Education

Ministry of Finance and Planing, Law and order, Local Government and Provincial Administration, Man Power, Tamil Education and Muslim Schools Activities, Culture Affairs, Land, Trade and Commerce, Food Supplies and Distribution, Tourism, Sports and Investment Coordination Portfolios which are not taken under any other Ministries

පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ.
மாகாண சபைக் கட்டிடத் தொகுதி, பல்லேகலை, குண்டசாலை.
Provincial Council Complex, Pallekele, Kundasale.

විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail : pemcentral@gmail.com — වෙබ් අඩවිය / இணையம் / Website : www.cpem.lk

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යංශ කාර්යාලය / அமைச்சு அலுவலகம் / Ministry Office | 081-4181322 | ලේකම් / செயலாளர் / Secretary | 081-2124938 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / சிரேஷ்ட உதவிச் செயலாளர் / Senior Assistant Secretary | 081-2121936 | ප්‍රධාන ගණකාධිකාරී / பிரதம கணக்காளர் / Chief Accountant | 081-2124935 | ෆැක්ස් / தொலைநகல் / Fax | 0812121938 |
| මගේ අංකය / எனது இல. / My No | සිපිසි/සිඑස්එස්/I/30/Annual Transfer/2027 | ඔබේ අංකය / உமது இல. / Your No | | දිනය / திகதி / Date | 2026.06. 25 | | | | |


පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින්,
සියළු විදුහල්පතිවරුන් වෙත.

**<u>මධ්‍යම පළාත් සභාවට අනුයුක්ත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථානමාරු පටිපාටියට අනුව අයදුම්පත් කැඳවීම සම්බන්ධවයි</u>**

ගරු.ආණ්ඩුකාරතුමන් විසින් 2024.07.25 දිනැතිව අනුමත කර ඇති මධ්‍යම පළාත් සභාවට අනුයුක්ත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථානමාරු පටිපාටිය හා 2025.08.25 දිනැතිව සංශෝධන අංක 01 අනුව මධ්‍යම පළාත් සභාවට අයත් පළාත් පාසල්හි ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ centralprovinceedu.lk පළ කර ඇති අයදුම්පත්‍රය නියමිත පරිදි සම්පූර්ණ කර භාගත කරන ලද අයදුම්පත්‍රය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කරන ලෙස දන්වමි.

02. අයදුම්පත් පිරවීමේදී මධ්‍යම පළාත් සභාවට අනුයුක්ත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථානමාරු පටිපාටියෙහි සඳහන් පහත උපදෙස් කෙරෙහි අවධානය යොමු කරන ලෙස දන්වමි.

i. මෙම ස්ථානමාරු සඳහා අයදුම්පත් යොමු කළ හැක්කේ පළාත් සභා පාසලක රාජකාරි කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I,II හා III ශ්‍රේණියේ නිලධාරීන්ට පමණි.

ii. කිසියම් පාසලක අවම වශයෙන් වසර 03ක් වත් සේවය කළ නිලධාරීන්හට මෙ සඳහා අයදුම් කළ හැක.

iii. 2026.12.31 දිනට එක් සේවා ස්ථානයක අඛණ්ඩව වසර 06ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම විදුහල්පති ශ්‍රේණිධාරීන් අනිවාර්යයෙන් ස්ථානමාරු සඳහා අයදුම් කළ යුතු වේ.

iv. වාර්ෂික ස්ථානමාරු කිරීමේදී පළාත් පාසල්හි විදුහල්පතිවරු ලෙස පත් කරන ලද නිලධාරීන් අතර පමණක් ස්ථානමාරු සිදු කරනු ලැබේ. තවද, පළාත් පාසල්හි ස්ථිර විදුහල්පති තනතුරුවල ඇතිවන පුරප්පාඩු සඳහා වාර්ෂික ස්ථානමාරු පටිපාටිය අනුව ස්ථානමාරු කරනු නොලබන අතර, සම්මුඛ පරීක්ෂණ මගින් එම පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

v. ඉල්ලුම් කළ සේවා ස්ථාන ලබාදීමට මාරු මණ්ඩලය මගින් සෑම විටම උත්සාහ දරණ අතර එසේ නොහැකි වුවහොත් මාරු මණ්ඩලයේ අභිමතය පරිදි වෙනත් සුදුසු පාසලක් වෙත ස්ථානමාරු කරනු ලැබේ.

CamScanner

CamScanner

vi. වයස අවුරුදු 58 ඉක්මවූ නිලධාරීන් ඔවුන්ගේ ඉල්ලීම මත පමණක් ස්ථානමාරු සිදු කරනු ලබයි.

vii. අතිදුෂ්කර හා දුෂ්කර සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් වාර්ෂික ස්ථානමාරු වීම සඳහා අයදුම්කිරීමට සුදුසුකම් ලබයි. අපහසු නොවන, ප්‍රියමනාප/පහසු හා ඉතා ප්‍රියමනාප වඩාත් පහසු පරිදි සේවා කාලයන් සම්පූර්ණ කර ඇති නිලධරයන් අනිවාර්යයෙන්ම ස්ථානමාරුවීම් වලට යටත් වේ.

viii. විදුහල්පති ශ්‍රේණිධාරීන් විසින් භාගත කරන ලද අයදුම්පත්‍රය යොමු කිරීමේදී ඔහු/ඇයගේ වර්තමාන පාසලට ස්ථානගත කළ පත්වීම් ලිපියේ පිටපතක් අනිවාර්යයෙන්ම අමුණා එවිය යුතුය.

ix. ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය කරන ලද අධිසේවක පදනම මත පත්වීම් ලබා ඇති ශ්‍රේණිධාරීන් සිටී නම් ඔවුන්ද මෙම ස්ථාන මාරු කිරීම සඳහා අයදුම්පත් යොමු කිරීමට සුදුසුකම් ලබයි. (අදාළ අන්තර්ග්‍රහණය කරන ලද ලිපියේ පිටපතක් අමුණා එවිය යුතුය)

x. අධිසේවක පදනම මත පත්වීම් ලද නිලධාරීන් වාර්ෂික ස්ථානමාරු සඳහා සුදුසුකම් නොලබන අතර, අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් වැළකිය යුතුය.

xi. පළාත් පාසල්වල විදුහල්පති ලෙස කටයුතු කරන නිලධාරීන් ස්ථානමාරු කිරීමේදී ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025.07.23 දිනැතිව අනුමත කරන ලද විදුහල්පති පත් කිරීම පිළිබඳව සකස් කරන ලද මාර්ගෝපදේශය අනුව කටයුතු කරන බැවින් තම ශ්‍රේණියට අදාළව සුදුසු පාසල් ඉල්ලුම් කිරීමට කටයුතු කළ යුතු වේ.

M P

මධුපානි පියසේන,
ලේකම්,
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය.
මධ්‍යම පළාත.

CS CamScanner

CS CamScanner